© සියලුම හිමිකම් ඇවිරිණි

අනු අංකය: ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය
# අන්තර්මධ්‍ය අදියර
# 2010 මාර්තු විභාගය

විභාග දිනය : 2010 මාර්තු 27 — පිටු ගණන : 05

විභාග වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30 — ප්‍රශ්න ගණන : 06

අයදුම්කරුවන්ට උපදෙස්:

1. නියමිත කාලය පැය 3 කි.
2. A කොටසේ ප්‍රශ්න සියල්ලටම හා B කොටසින් ප්‍රශ්න 2 ක් ද, C කොටසින් එක් ප්‍රශ්නයක් ද තෝරාගෙන පිළිතුරු සපයන්න.
3. පිළිතුරු සැපයිය යුත්තේ සිංහල භාෂාවෙන් පමණි.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| **උසස් කළමනාකරණ ගිණුම්කරණය** | **(AMA / 602)** |

---

## A කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න අංක 01** *(ලකුණු 40)*

X භාණ්ඩය නිෂ්පාදනය කර අලෙවිකරන ලංකාසිරි ආයතනයේ කළමනාකරණ ගණකාධිකාරීවරයා වශයෙන් ඔබ මෑතක දී පත්කරනු ලැබ ඇත. ලංකාසිරි ආයතනයේ ශේෂ පත්‍රය පහත පරිදි වේ.

**2010 වර්ෂයේ මාර්තු 01 දිනට ශේෂ පත්‍රය**

| | පිරිවැය (රු.) | සමුච්චිත ක්ෂය (රු.) | ශුද්ධ පොත් අගය (රු.) |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 500,000 | - | 500,000 |
| යන්ත්‍ර හා උපකරණ | 124,000 | 84,500 | 39,500 |
| මෝටර් රථ | 42,000 | 16,400 | 25,600 |
| | 666,000 | 100,900 | 565,100 |
| **ජංගම වත්කම්** | | | |
| අමුද්‍රව්‍ය තොග (ඒකක 100) | | 4,320 | |
| නිමි භාණ්ඩ තොග (ඒකක 100)* | | 10,450 | |
| ණයගැතියෝ (ජනවාරි රු. 7,680, පෙබරවාරි රු. 10,400) | | 18,080 | |
| මුදල් හා බැංකු | | 6,790 | 39,640 |
| | | | 604,740 |
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | | |
| සාමාන්‍ය කොටස් | | | 560,000 |
| **සංචිත** | | | |
| ලාභාලාභ ගිණුම | | | 40,840 |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියෝ (අමුද්‍රව්‍ය) | | | 3,900 |
| | | | 604,740 |

* නිමි භාණ්ඩ තොගය අගය කරනු ලබනුයේ ආන්තික පිරිවැය මත ය.

ඉදිරි මාස හතරක කාලපරිච්ඡේදය සඳහා ඇස්තමේන්තු කළ අගයන් පහත දැක්වේ.

| | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි |
|---|---|---|---|---|
| විකුණුම් (ඒකක) | 80 | 84 | 96 | 94 |
| නිෂ්පාදන (ඒකක) | 70 | 75 | 90 | 90 |
| අමුද්‍රව්‍ය ගැනුම් (ඒකක) | 80 | 80 | 85 | 85 |
| වැටුප් හා විචල්‍ය පොදුකාර්ය පිරිවැය (ඒකකයකට රු. 65 බැගින්) | රු. 4,550 | රු. 4,875 | රු. 5,850 | රු. 5,850 |
| ස්ථාවර පොදුකාර්ය පිරිවැය | රු. 1,200 | රු. 1,200 | රු. 1,200 | රු. 1,200 |

මෙම ආයතනය එක් ඒකකයක් රු. 219/- කට අලෙවි කිරීමට අදහස් කර ඇති අතර, අමුද්‍රව්‍ය ඒකකයක් සඳහා රු. 45/- ගෙවීමට සිදුවෙතැයි ඇස්තමේන්තු කර ඇත. එක් නිමි භාණ්ඩයක් නිපදවීම සඳහා එක් අමුද්‍රව්‍ය ඒකකයක් අවශ්‍ය වේ.

සියලුම විකුණුම් හා අමුද්‍රව්‍ය මිලට ගැනුම් ණයට සිදු වේ. ණයගැතියන් සඳහා මාස දෙකක කාලයක් ණය පියවීමට ලබා දෙන අතර, අමුද්‍රව්‍ය සැපයුම්කරුවනට මසකට පසු ගෙවීම් කරනු ලබයි. වැටුප්, විචල්‍ය හා ස්ථාවර පොදුකාර්ය පිරිවැය එම පිරිවැය දරුනු ලබන මාසය තුළ දීම ගෙවනු ලබයි.

ව්‍යාපාරයේ ඉඩම් හා ගොඩනැගිලි ඇපයට තබා 7.5% පොලී අනුපාතය යටතේ රු. 120,000/- ක මුදලක් මැයි මස 01 වන දින ලැබීමට නියමිත ය. පිරිවැය රු. 112,000/- ක් වූ යන්ත්‍රයක් මැයි මස තුළ දී මිල දී ගනු ලබන අතර, ඒ සඳහා මුදල් ගෙවනු ලබන්නේ ජුනි මාසය තුළ දී ය.

ණය මුදල සඳහා වූ පොලිය සැප්තැම්බර් මස සිට ඉදිරියට සෑම අර්ධ වර්ෂයක් සඳහාම ගෙවිය යුතු ය. මාර්තු 31 වන දින සඳහා වූ රු. 12,500/- ලාභාංශ ජුනි මස ගෙවීමට නියමිත ය.

අලුතින් මිලදී ගත් යන්ත්‍ර ද ඇතුළුව, ඉදිරි මාස හතර සඳහා වූ ක්ෂයවීම් පහත දැක්වේ.

| | |
|---|---|
| යන්ත්‍ර හා උපකරණ | රු. 15,733 |
| මෝටර් රථ | රු. 3,500 |

ආයතනය තොග අගය කිරීම සඳහා පෙර පිවිසි පෙර නිකුතු (FIFO) ක්‍රමය යොදා ගනී. ගණනය කිරීම්වල දී බදු නොසලකා හරින්න.

**අවශ්‍යවන්නේ,**

(a) මාර්තු මස සිට ජුනි මස දක්වා (ජුනි මස ද ඇතුළත්ව) එක් එක් මාසය සඳහා අමුද්‍රව්‍ය අයවැය හා නිමි තොග අයවැය ඒකක මගින් ගණනය කර ඉදිරිපත් කරන්න. **(ලකුණු 5)**

(b) එම කාලපරිච්ඡේදයේ එක් එක් මාසය සඳහා වූ විකුණුම් අයවැය, නිෂ්පාදන පිරිවැය අයවැය හා අයවැයගත අවසන් ණයගැතියෝ, ණයහිමියෝ හා තොග වටිනාකම් ගණනය කරන්න. **(ලකුණු 5)**

(c) මාර්තු සිට ජුනි දක්වා මාස හතර සඳහා එක් එක් මාසය සඳහා වෙන් වෙන්ව දක්වමින් මුදල් අයවැය පිළියෙල කරන්න. **(ලකුණු 6)**

(d) ජුනි මස 30 වන දිනෙන් අවසන් මාස හරත සඳහා වූ ප්‍රධාන අයවැය (Master Budget) (එනම් අයවැයගත ලාභාලාභ ගිණුම හා ශේෂ පත්‍රය) වෙළඳ හා ලාභාලාභ ගිණුම සහ ශේෂ පත්‍රය පිළියෙල කරන්න. **(ලකුණු 10)**

(e) ලංකාසිරි ආයතනය විසින් පිළියෙල කරන ලද මුදල් අයවැය පෙර පෝෂණ (Feed forward) හා පසු පෝෂණ (Feed back) පාලන ක්‍රමයක් ලෙෂ මුදල් වඩා හොඳින් කළමනාකරණය කිරීම සඳහා යොදා ගනු ලබන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. **(ලකුණු 7)**

(f) ''වාර්ෂික අයවැයකරණයේ ආවේනික දුර්වලතාවයන් ගණනාවක් ඇති අතර, එය ආයතනයක උපායක්‍රමික වෙනස්වීම් හා නම්‍යශීලීත්වය සඳහා බාධාවක් වී ඇති බවට තර්කයක් ඇත.'' ඉහත ප්‍රකාශයට අදාළව වාර්ෂික අයවැයක ඇති සීමා විස්තර කරන්න. **(ලකුණු 7)**

**(මුළු ලකුණු 40)**

**A කොටස අවසානයි**

## B කොටස

ප්‍රශ්න 2 කට පමණක් පිළිතුරු සපයන්න.

### ප්‍රශ්න අංක 02 *(ලකුණු 20)*

රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය කරන සමාගමක් කාර්මික තීන්ත (Industrial Paint) වර්ගයක ලීටර් 10 ක් නිෂ්පාදනය කිරීමට පහත දැක්වෙන ප්‍රමිත සකස් කර ඇත.

| | |
|---|---|
| ලීටර් 05 | අමුද්‍රව්‍ය A ලීටරයක් රු. 350/- බැගින් |
| ලීටර් 06 | අමුද්‍රව්‍ය B ලීටරයක් රු. 450/- බැගින් |

මෙම ආයතනය ජිට් ක්‍රමය (JIT) මත පදනම්ව අමුද්‍රව්‍ය මිලදී ගන්නා බැවින් අමුද්‍රව්‍ය තොග පවත්වා නොගනී. මෙම කාලපරිච්ඡේදය තුළ දී ආයතනය විසින් කාර්මික තීන්ත ලීටර් 10,000 ක් නිෂ්පාදනය කරන ලදී.

සත්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම් හා භාවිතයන් පිළිබඳ තොරතුරු පහත පරිදි ඔබට සපයා ඇත.

| සත්‍ය මිලදී ගැනීම් හා භාවිතයන් | අමුද්‍රව්‍ය වර්ගය | සත්‍ය මිල |
|---|---|---|
| ලීටර් 4,600 | අමුද්‍රව්‍ය A | රු. 1,656,000 |
| ලීටර් 5,900 | අමුද්‍රව්‍ය B | රු. 2,625,500 |

අවශ්‍යවන්නේ:

(a) මුළු ද්‍රව්‍ය විචලනය ගණනය කර එය මිල, භාවිත, මිශ්‍රණ (mix) හා ඵල (yield) ලෙස විශ්ලේෂණය කරන්න. ඔබ විසින් ගණනය කරන ලද ද්‍රව්‍ය මිශ්‍රණ හා ඵලදා විචලනයන් අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරන්න. **(ලකුණු 10)**

(b) කළමනාකරණ පාලනය (Managerial Control) සඳහා ද්‍රව්‍ය මිශ්‍රණ හා ඵලදා විචලනයන් අදාළ වන අවස්ථා පැහැදිලි කරන්න. **(ලකුණු 6)**

(c) ප්‍රමිත පිරිවැයකරණයට අදාළව පහත පද විස්තර කරන්න.

(i) ළඟාකරගත හැකි ප්‍රමිත (Attainable standards)

(ii) ව්‍යතිරේක වාර්තාකරණය (Exception reporting) **(ලකුණු 4)**

**(මුළු ලකුණු 20)**

### ප්‍රශ්න අංක 03 *(ලකුණු 20)*

විකුණුම් හා අලෙවිකරණ දෙපාර්තමේන්තුව 'ලංකා ටෝයිස්' ආයතනයෙහි මෑතක දී ප්‍රචාරණ ව්‍යාපාරයක් කිරීමෙන් පසු සෙල්ලම් බඩු ඒකක 10,000 ක් ඒකකයක් රු. 500 බැගින් විකිණීමට විකුණුම් අයවැය සකස් කර ඇත. එනමුදු නිෂ්පාදන කළමනාකරු ඔබ වෙත දන්වා සිටින්නේ ආයතනයේ සාමාන්‍ය නිෂ්පාදන ධාරිතාවය සෙල්ලම් බඩු ඒකක 8,000 ක් බවයි. ඔහු විසින් පහත දැක්වෙන මෙහෙයුම් අයවැය ඔබට ඉදිරිපත් කර ඇත.

| | රු. '000 | රු. '000 |
|---|---|---|
| විකුණුම් | | 4,000 |
| වියදම් | | |
| අමුද්‍රව්‍ය | 640 | |
| සෘජු වැටුප් | 2,240 | |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 320 | |
| පරිපාලන වියදම් | 150 | |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 240 | 3,590 |
| ලාභය | | 410 |

නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයෙන් 50% ස්ථාවර පිරිවැය වන බව හා විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැයෙන් 20% විකුණුම් පරිමාව හා විචලනය වන බව නිෂ්පාදන කළමනාකරු දක්වා ඇත.

නිෂ්පාදන ධාරිතාවය ඒකක 10,000 දක්වා වැඩිකර ආයතනයට වෙළඳපොළෙහි පවත්නා මුළු ඉල්ලුම ළඟාකර ගැනීමට නිෂ්පාදන කළමනාකරු පහත විකල්ප යෝජනා කරයි.

1. උප කොන්ත්‍රාත්තු මාර්ගයෙන් එකක් රු. 410/- බැගින් නිෂ්පාදන ඒකක 2,000 ක් මිලට ගැනීම.
2. පැයකට රු. 80/- බැගින් වූ අමතර සෘජු ශ්‍රම පැය 10,000 ක අමතර වැඩ මුරයක් ලබාදීම. මෙමගින් ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයෙහි කිසිදු වැඩිවීමක් සිදු නොවේ.
3. සාමාන්‍ය නිෂ්පාදන ධාරිතාවය වැඩිකිරීම සඳහා අමතර යන්ත්‍රයක් ලබාදීම. මෙමගින් ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. 40,000/- කින් වාර්ෂිකව වැඩින අතර, සෙල්ලම් බඩු ඒකකයකට දරන්නා වූ විචල්‍ය පිරිවැයෙහි කිසිදු වෙනස්වීමක් සිදු නොවේ.

නිෂ්පාදන පරිමාව ඉහළ නැංවීම සඳහා පහත කුමන විකල්පය තෝරා ගනු ලැබවු ද, අමතර පරිපාලන ස්ථාවර වියදම් රු. 15,000/- ක් හා විකුණුම් හා බෙදාහැරීමේ ස්ථාවර පිරිවැය රු. 25,000/- ක් සෑම විකල්පයක් සඳහාම දැරීමට සිදු වේ.

**අවශ්‍යවන්නේ:**

(a) ඉහත දැක්වූ විකල්පයන් තුනෙන් පැනනගින අමතර පිරිවැය හා ආදායම් දක්වමින් ප්‍රකාශයක් පිළියෙල කරන්න. එමගින් මූල්‍යමය වශයෙන් වඩාත්ම සුදුසු විකල්පය හඳුනාගන්න. **(ලකුණු 12)**

(b) ඔබ විසින් ඉහත හඳුනාගනු ලැබූ නිර්දේශය මත පදනම් සංශෝධිත මෙහෙයුම් අයවැයක් කළමනාකාරීත්වය වෙත පිළියෙල කරන්න. මේ සඳහා ආන්තික පිරිවැයකරණ මූලධර්ම යොදා ගන්න. **(ලකුණු 5)**

(c) තීරණ ගැනීම හා සම්බන්ධව පහත යෙදුම් විස්තර කරන්න.
   (i) වෙනස්වන පිරිවැය (Differential Costs)
   (ii) ගෙවීමට බැඳී ඇති පිරිවැය (Committed Costs)
   (iii) අපරිමිත පිරිවැය (Out-of-pocket costs) **(ලකුණු 3)**

**(මුළු ලකුණු 20)**

**<u>ප්‍රශ්න අංක 04</u>** ***(ලකුණු 20)***

(a) ග්ලෝබල් ආයතනය ඒසියා, ඇෆ්රිකා සහ ඇමෙරිකා නමින් ප්‍රධාන භාණ්ඩ වර්ග තුනක් නිපදවයි. භාණ්ඩ වර්ග තුන සඳහාම යොදාගන්නා නිෂ්පාදන ක්‍රමයන් බොහෝදුරට එකිනෙකට සමාන වේ.

භාණ්ඩ වර්ග තුනට අදාළ විස්තර පහත දක්වා ඇත.

| භාණ්ඩය | එක් ඒකකයක් සඳහා ශ්‍රම පැය | එක් ඒකකයක් සඳහා යන්ත්‍ර පැය | එක් ඒකකයක් සඳහා අමුද්‍රව්‍ය පිරිවැය | නිෂ්පාදන ධාරිතාවය (ඒකක) |
|---|---|---|---|---|
| ඒසියා | 1 | 3 | 4,000 | 1,500 |
| ඇෆ්රිකා | 3 | 2 | 2,400 | 2,500 |
| ඇමෙරිකා | 2 | 6 | 5,000 | 14,000 |

මෙම ආයතනය දැනට පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරනුයේ යන්ත්‍ර පැය මත පදනම්වයි. පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය යන්ත්‍ර පැයක් සඳහා රු. 56/- කි. සෘජු ශ්‍රමය සඳහා පැයකට අනුපාතය රු. 600/- කි.

ඉහත භාණ්ඩ වර්ග තුන සඳහා සාම්ප්‍රදායික අන්තර්ග්‍රහණ පිරිවැයකරණය යොදා ගනිමින් ඒකකයක පිරිවැය ගණනය කරන්න. **(ලකුණු 4)**

ආයතනයේ කළමනාකරණ අධ්‍යක්‍ෂවරයා ක්‍රියාවලි පදනම් පිරිවැයකරණය සම්බන්ධයෙන් වූ වැඩමුළුවකට සහභාගී වී ඇත. ක්‍රියාවලි පදනම් පිරිවැයකරණයේ ඇති වාසි නිසා භාණ්ඩවල පිරිවැය ගණනය කිරීම සඳහා මෙම ක්‍රමය යොදාගැනීමට ඔහු උනන්දුවක් දක්වයි. මේ සම්බන්ධයෙන් ඔබ විසින් පහත සඳහන් තොරතුරු රැස්කරගෙන ඇත.

| පිරිවැය වර්ග | සම්පූර්ණ පොදුකාර්ය පිරිවැයෙන් සියයට අනුපාතය |
|---|---|
| ස්ථානගත කිරීමේ පිරිවැය | 35 |
| යන්ත්‍ර පිරිවැය | 20 |
| ද්‍රව්‍ය සංචලන පිරිවැය | 15 |
| පරීක්‍ෂා කිරීමේ පිරිවැය | 30 |
| මුළු නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 100% |

සම්පූර්ණ කාලපරිච්ඡේදය සඳහා එක් එක් භාණ්ඩයට අදාළ ක්‍රියාකාරමකම් පරිමාණයන් පහත දක්වා ඇත.

| භාණ්ඩ වර්ගය | ස්ථානගත කිරීම් ගණන | ද්‍රව්‍ය සංචලනයන් ගණන | පරීක්‍ෂාවන් ගණන |
|---|---|---|---|
| X භාණ්ඩය | 150 | 24 | 300 |
| Y භාණ්ඩය | 230 | 42 | 360 |
| Z භාණ්ඩය | 960 | 174 | 1340 |
| | 1340 | 240 | 2000 |

අවශ්‍යවන්නේ:

(b) ක්‍රියාවලි පදනම් මූලධර්ම යොදා ගනිමින් ඉහත භාණ්ඩ වර්ග තුන සඳහා ඒකකයක පිරිවැය ගණනය කරන්න. (ලකුණු 10)

(c) ඔබගේ ඉහත (a) සහ (b) කොටස්වලට පිළිතුරු වශයෙන් ලැබුණු පිරිවැය අගයයන්ගේ වෙනස්වීම් ඇත්නම් ඒ සඳහා හේතු දක්වන්න. (ලකුණු 3)

(d) ග්ලෝබල් ආයතනයේ ක්‍රියාවලි පදනම් පිරිවැයකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට උත්සාහ දැරීමේ දී ඇති විය හැකි ගැටලු දෙකක් විස්තර කරන්න. (ලකුණු 3)

(මුළු ලකුණු 20)

A කොටස අවසානයි

## C කොටස

<u>එක් ප්‍රශ්නයකට</u> **පමණක් පිළිතුරු සපයන්න.**

**<u>ප්‍රශ්න අංක 05 *(ලකුණු 20)*</u>**

විවිධ දෙපාර්තමේන්තුව කළමනාකරුවන් හා අයවැය කමිටු (Budget Committee) සම්බන්ධ කරගනිමින් සිදුකරන අයවැය පිළියෙල කිරීම ඉතා දිගු ක්‍රියාවලියකි. අවසන් ප්‍රධාන අයවැය (Master Budget) කළමනාකරණ පාලනය සඳහා යොදා ගැනීමේ දී වඩා ප්‍රයෝජනවත් වීම සඳහා මෙම ක්‍රියාවලිය ඉහත අවධානයෙන් කළ යුතු ය.

(a) විවිධ දෙපාර්තමේන්තු කළමනාකරුවන්ගේ හා අයවැය කමිටුවේ කාර්යභාරයන් වෙන් වෙන්ව හඳුනාගනිමින් අයවැය සකස් කිරීමේ අදියරයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(b) ශුන්‍ය පාද අයවැයකරණය (Zero-based budgeting) හා එය අනෙකුත් සාම්ප්‍රදායික අයවැයකරණයන්ගෙන් වෙනස්වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. ලාභ අරමුණු කරගත් ආයතනයන් සඳහා ශුන්‍ය පාද අයවැයකරණයේ යෝග්‍යතාව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 06 *(ලකුණු 20)*</u>**

ගුණත්වය අවධාරණය කරමින් රොබෝවරු නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගන්නා නූතන පරිසරය තුළ ප්‍රමිත පිරිවැයකරණයේ ප්‍රයෝජනවත් බව හා යෝග්‍යතාව ප්‍රශ්න කෙරෙමින් පවතී.

(a) ප්‍රමිත පිරිවැයකරණය නූතන නිෂ්පාදන පරිසරය තුළ යොදාගැනීමේ දී මතුවන ගැටලු සඳහන් කරන්න. (ලකුණු 10)

(b) ප්‍රමිත පිරිවැයරකණ පද්ධතියක් තුළින් නිරන්තරයෙන් වාර්තාවන විචලනයක් විමර්ෂණය කළ යුතු ද, නැද්ද යන්න තීරණය කිරීමේ දී සලකා බලනු ලබන සාධක පැහැදිලි කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

C අංශය අවසානයි

***ප්‍රශ්න පත්‍රය අවසානයි***